# 6 ශ්‍රේණිය සිංහල -2022

## 04 ඒකකය

## අක්ෂරමාලාව හා පිලි



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

06 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 02ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 04. අක්ෂරමාලාව හා පිළි

අපි කතා කිරීමේ දී විවිධ ශබ්ද මුවින් නිකුත් වෙයි. ඒ ශබ්ද ලියා දැක්වීම සඳහා භාවිත කෙරෙන විවිධ සංකේත **අක්ෂර** නමින් හැඳින්වේ. එක් භාෂාවකට අයත් අක්ෂර සියල්ල එකතු වූ විට එය **හෝඩිය** හෙවත් **අක්ෂරමාලාව** යනුවෙන් නම් කළ හැකි ය.

- අක්ෂර 60කින් යුත් සිංහල අක්ෂරමාලාව ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.
  1. ස්වර
  2. ව්‍යඤ්ජන

**ස්වර 18**

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |

**ව්‍යඤ්ජන 42**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

## ❖ ස්වර

- වෙනත් අක්ෂරයක (ශබ්දයක) උපකාරයකින් තොරව, තනිව උච්චාරණය කළ හැකි අක්ෂර ස්වර නම් වේ. ස්වර ශබ්ද නිරූපණය කිරීමට යෙදෙන අක්ෂර ප්‍රාණාක්ෂර (පණකුරු) නම් වේ.

ස්වර අක්ෂර 18කි.

- ස්වරයක් ඊට නියමිත රූපයෙන් ම ලියන්නේ වචනයක මුල් ශබ්දය හැටියට යෙදෙන අවස්ථාවල දී පමණි.

  - ✓ අ - අම්මා
  - ✓ ආ - ආතා
  - ✓ ඇ - ඇඹුල්
  - ✓ ඈ - ඈත
  - ✓ ඉ - ඉවුර
  - ✓ ඊ - ඊතලය
  - ✓ උ - උකුස්සා
  - ✓ ඌ - ඌරා
  - ✓ ඍ - ඍජුකෝණය
  - ✓ එ - එන්න
  - ✓ ඒ - ඒදණ්ඩ
  - ✓ ඓ - ඓතිහාසික
  - ✓ ඔ - ඔංචිල්ලාව
  - ✓ ඕ - ඕලු
  - ✓ ඖ - ඖෂධ

- ස්වරයක්, වචනයක මැද හෝ අග යෙදෙන විට ඒවා ව්‍යඤ්ජන ශබ්දයක් හා එකතු කොට ලියනු ලැබේ.

  - ✓ ර් + උ → රු
  - ✓ ද් + ඇ → දැ
  - ✓ ග් + ඉ → ගි
  - ✓ ඔරුව → ඔ+ර්+උ+ව්+අ
  - ✓ උදැල්ල → උ+ද්+ඇ+ල්+ල්+අ
  - ✓ ගිනි → ග්+ඉ+න්+ඉ
  - ✓ නදුන් → න්+අ+ද්+උ+න්
  - ✓ සඳනි → ස්+අ+ං+ද්+අ+න්+ඉ

## ❖ ව්‍යඤ්ජන

- තනිව උච්චාරණය කළ නොහැකි, ස්වර සමග එකතු කිරීමෙන් පහසුවෙන් උච්චාරණය කළ හැකි අකුරු ව්‍යඤ්ජන අක්ෂර යි. ව්‍යඤ්ජන ශබ්ද නිරූපණය කිරීමට යොදන අක්ෂර ගාත්‍රාක්ෂර (ගතකුරු) නම් වේ.

ව්‍යඤ්ජන අක්ෂර 42කි..

- මෙම අක්ෂර ස්වරයක් සමග යෙදෙන විට උච්චාරණය පහසු වේ.

✓ ක් + අ → ක
✓ ග් + අ → ග
✓ ච් + අ → ච
✓ ජ් + අ → ජ
✓ ර් + උ → රු
✓ ද් + ඇ → දැ
✓ ග් + ඉ → ගි

- සෑම ව්‍යඤ්ජනයක් ම එලෙස හල් කළ නො හැකි ය.

✓ (අ)ං
✓ (අ)ඃ
✓ ඟ
✓ ඦ
✓ ඬ
✓ ඳ
✓ ඹ
✓ ළ

- ඉහත පරිදි ස්වර අක්ෂර, ව්‍යඤ්ජන අක්ෂර සමග එකතු වීමේ දී එය සංකේතවත් කෙරෙන පිලි රාශියක් සිංහල භාෂාවේ දක්නට ලැබේ.

| ස්වරය | පිල්ල | පිලි නාමය | යෙදෙන අයුරු |
|---|---|---|---|
| ක් + අ | නැත | විශේෂ පිල්ලමක් නැත | කපුරු |
| ක් + ආ | ා | ඇලපිල්ල | කාක්කා |
| ක් + ඇ | ැ | කෙටි ඇදපිල්ල/ ඇදය/ ඇකාරාංශය | කාක්කා |
| ක් + ඈ | ෑ | දිගු ඇදපිල්ල/ දික් ඇද පිල්ල/ දීර්ඝ ඇදය/ දීර්ඝ ඇකාරාංශය | කෑරලා |
| ක් + ඉ | ි | ඉස්පිල්ල | කිකිළිය |
| ක් + ඊ | ී | දීර්ඝ ඉස්පිල්ල/ දිගු ඉස්පිල්ල | කීර්තිය |
| ක් + උ | ු ැ ු | පාපිල්ල | කුඩය |
| ක් + ඌ | ූ ෑ ූ | දීර්ඝ පාපිල්ල/දිගු පාපිල්ල | කූඩය |
| ක් + ඍ | ෘ | ගැට ඇලපිල්ල/ගැටපිල්ල | කෘතඥ |
| ත් + ඎ | ෲ | ගැට ඇලපිලි දෙක | කෲර |

| | | | |
|---|---|---|---|
| ක් + එ | ෙ | කොම්බුව | කෙක්ක |
| ක් + ඒ | ේ/ේ | කොම්බුව සහිත දීර්ඝත්ව සලකුණ | කේතලය |
| ක් + ඓ | ෛ | කොම්බු දෙක | කෛරාටික |
| ක් + ඔ | ො | කොම්බුව හා ඇලපිල්ල | කොටුව |
| ක් + ඕ | ෝ | කොම්බුව හා දීර්ඝත්ව සලකුණ සහිත ඇලපිල්ල | කෝප්පය |
| ක් + ඖ | ෞ | කොම්බුව හා ගයනුකිත්ත | කෞමදී |

## අවබෝධය

1. ස්වරයක් හෝඩියේ දැක්වෙන රූපයෙන් ම ලියන්නේ වචනයක කුමන ස්ථානයේ යෙදෙන විට ද?
2. හල් කළ නො හැකි ව්‍යඤ්ජන අක්ෂර දෙකක් ලියන්න.
3. පිල්ලකින් සංකේතවත් නො වන ස්වරය කුමක් ද?
4. එක ම ස්වරයක් සංකේතවත් කිරීමට විවිධ අකුරුවලට විවිධ පිලි භාවිත කෙරෙන ස්වර, පාඩමේ වගුවෙන් උපුටා ලියන්න.
5. පිලි දෙකකට වඩා භාවිත කරමින් සංකේතවත් කරන්නේ කිනම් ස්වරය ද?

- **අවබෝධය**

1. වචනයක මුල් ශබ්දය හැටියට යෙදෙන අවස්ථාවල දී පමණි.
2. (අ)ං, (අ)ඃ, ඟ, ඦ, ඬ, ඳ, ඹ, ළ
3. අ
4. උ, ඌ
5. ඕ

## ලිඛිත අභ්‍යාස

1. පෙළ පොතේ ඇති පාඩම්වලින් ස්වර මුලට යෙදෙන වචන හා ව්‍යඤ්ජන මුලට යෙදෙන වචන දහය බැගින් වගුවක සටහන් කරන්න.

- **ලිඛිත අභ්‍යාස**

**1.**

| ස්වර මුලට යෙදෙන වචන | ව්‍යඤ්ජන මුලට යෙදෙන වචන |
|---|---|
| ඔවුහු | පොරමොලා |
| ඉතිරි | කුඩමසුන් |
| උදයේ | වැද්දන් |
| අතර | හපන්ට |
| අහසේ | රැවටිච්චී |
| ඉහත | පොරොන්දු |
| අකුණු හඬ | නෙලුම් |
| අවශ්‍ය | කුරුල්ලෝ |
| උදැල්ල | තාලයකට |
| ඉඳීමෙන් | නපුරු |
| ඔන්න | නිශ්ශබ්දව |

2. පහත සඳහන් අක්ෂර යෙදෙන වචන දෙක බැගින් ලියන්න.

i. ඉ
ii. උ
iii. ඍ
iv. ඓ
v. ඖ

3. පහත සඳහන් පිළි යෙදෙන වචන දෙක බැගින් ලියන්න.

i. ඇලපිල්ල
ii. දිගු පාපිල්ල
iii. ඉස්පිල්ල
iv. කොම්බුව සහ ඇලපිල්ල
v. කොම්බුව

**2.**

I. ඉබ්බා, ඉරමුසු
II. උදැල්ල, උණුසුම
III. ඍජු, ඍණ
IV. ඓතිහාසික, ඓරාවණ
V. ඖෂධ, ඖචිත්‍ය

3.

I. කාසිය, සාදය
II. රූමත්, දූපත
III. කිරණ, සියල්ල
IV. කොළඹ, පොකුණ
V. කෙසෙල්, කෙළවරක

## ප්‍රායෝගික අභ්‍යාස (Home Work)

### ප්‍රායෝගික අභ්‍යාස

1. දිනපතා පළවන පුවත්පතක් හෝ ළමා නවකතාවක් හෝ තෝරා ගෙන එහි ඇති පිලි යෙදෙන වචන අනුපිළිවෙළින් ලියා පොත් පිංචක් සකස් කරන්න. ඔබ තෝරා ගත් පිල්ල සහිත අක්ෂරය පාට කරන්න.
2. සිංහල අක්ෂරමාලාව පන්තිය ඉදිරියේ මතකයෙන් කියවන්න.



4 වන පාඩම

## අක්ෂර මාලාව හා පිළි

(1) නූතන සිංහල අක්ෂර මාලාව ලියා එහි අති ස්වර හා ව්‍යඤ්ජන වෙන් කරන්න.

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

(2) ස්වර හඳුන්වන්න.

..........................................................................................
..........................................................................................
..........................................................................................

(3) ව්‍යඤ්ජන හඳුන්වන්න.

..........................................................................................
..........................................................................................
..........................................................................................

(4) ඉස්පිල්ල, ඇලපිල්ල, දිගු ඇදපිල්ල යෙදෙන වචන 5 බැගින් ලියන්න.

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

(5) එම වචන යොදා වාක්‍ය තනන්න.

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

# අක්ෂරමාලාව හා පිල්ලම්

පාඩම හොඳින් කියවා පහත අභ්‍යාසවලට පිළිතුරු සපයන්න.

**01.** **හිස්තැනට වඩාත් සුදුසු වචනය කොටුව තුළින් තෝරා ලියන්න.**

I කතා කිරීමේ දී මුවින් පිට කරන ශබ්ද ලියා දැක්වීම සඳහා භාවිත කරන සංකේත ______________ නම් වේ.
II එක් භාෂාවකට අයත් අකුරු සියල්ල එකතු වූ විට එය ______________ යනුවෙන් හඳුන්වයි.
III හෝඩියට කියන තවත් නමක් නම් ______________ යි.
IV නූතන සිංහල අක්ෂර මාලාවේ මුළු අකුරු ගණන ______________ වේ.
V නූතන සිංහල හෝඩියේ ______________ 18 කි.

| ස්වර අකුරු | අක්ෂර | වර්ණ මාලාව | හැටක් | හෝඩිය |
|---|---|---|---|---|

**02.** **නිවැරදි පිළිතුර තෝරන්න**

I නූතන සිංහල හෝඩිය ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. එනම්,

(අ) ස්වර අක්ෂර හා ව්‍යඤ්ජන අක්ෂර
(ආ) අල්පප්‍රාණ අක්ෂර හා මහාප්‍රාණ අක්ෂර
(ඇ) ස්වර අක්ෂර හා සඤ්ඤක අක්ෂර
(ඈ) මහාප්‍රාණ අක්ෂර හා සඤ්ඤක අක්ෂර

II වර්තමාන සිංහල හෝඩියේ ව්‍යඤ්ජන අක්ෂර ගණන _______

(අ) 20 කි.
(ආ) 32 කි.
(ඇ) 42 කි.
(ඈ) 38කි.

III ස්වර හා ව්‍යඤ්ජන අක්ෂර නිවැරදි ව වෙන් කර ලියා ඇති වචනය වනුයේ,

(අ) ඔ+ර්+රු+ච්+අ
(ආ) උ+ද්+ඇ+ල්+ල්+අ
(ඇ) ක්+අ+ත්+අ+ර් +ග්+ම
(ඈ) ජ්+අ+න්+ස+ල්+අ

IV තනිව උච්චාරණය කළ හැකි අක්ෂර _______ නම් වේ.

(අ) සඤ්ඤක අක්ෂර
(ආ) මහාප්‍රාණ අක්ෂර
(ඇ) ව්‍යඤ්ජන අක්ෂර
(ඈ) ස්වර අක්ෂර

**අන්තර්ගතය : ඩබ්.ජී.ඒ.සී.දිල්හානි මිය, වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව**
**සැකසුම : එස්.ඒ.ආර්.එල්.සමරතුංග, ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක.බලංගොඩ**

V ව්‍යඤ්ජන අක්ෂවලට අයත් වුව ද හල් ස්වරූපයෙන් නො පවතින අක්ෂරයක් වනුයේ,

(අ) ම
(ආ) ස
(ඇ) ඟ
(ඈ) ක

**03. 'අ' තීරුවේ දක්වා ඇති පිල්ලම් නාමය ඇතුළත් වචනය 'ආ' තීරුවෙන් තෝරා යා කරන්න.**

| අ | ආ |
|---|---|
| ඇලපිල්ල | දෛවය |
| කෙටි ඉස්පිල්ල | පේර |
| දිගු පාපිල්ල | කාලය |
| කොම්බුව හා හල් ලකුණ | කිතුල් |
| කොම්බු දෙක | කුඹියා |

**04. හිස්තැනට ගැළපෙන අක්ෂරය වරහන් තුළින් තෝරන්න**

I ප්‍ර _ල (බ/භ)
II වර්_නය (ධ/ද)
III ප්‍රමු_ (ක/ඛ)
IV ග්‍රන්_ය (ත/ථ)
V සමස්_ (ත/ථ)

**අන්තගර්තය : ඩබ්.ජී.ඒ.සී.දිල්හානි මිය, වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව**
**සැකසුම : එස්.ඒ.ආර්.එල්.සමරතුංග, ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක.බලංගොඩ**

# පිළිතුරු



**Answer**

4 වන පාඩම

අක්ෂර මාලාව හා පිලි

1.

**ස්වර 18**

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |

**ව්‍යඤ්ජන 42**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

2. වෙනත් අක්ෂරයක (ශබ්දයක) උපකාරයකින් තොරව, තනිව උච්චාරණය කළ හැකි අක්ෂර ස්වර නම් වේ. ස්වර ශබ්ද නිරූපණය කිරීමට යෙදෙන අක්ෂර ප්‍රාණාක්ෂර (පණකුරු) නම් වේ.

3. තනිව උච්චාරණය කළ නොහැකි, ස්වර සමග එකතු කිරීමෙන් පහසුවෙන් උච්චාරණය කළ හැකි අකුරු ව්‍යඤ්ජන අක්ෂර යි. ව්‍යඤ්ජන ශබ්ද නිරූපණය කිරීමට යොදන අක්ෂර ගාත්‍රාක්ෂර (ගතකුරු) නම් වේ.

4.

I. ඉස්පිල්ල - කිතුල්, මාපිය, පිහිටි, රාශියක්, නිදසුන්
II. ඇලපිල්ල - කාසිය, රබාන, මනාලිය, උපුටා, උද්දාමය
III. දිගු ඇදපිල්ල - කෑම, හැන්දෑව, රෑන, මෑත, කෑරලා

5.

I. ආච්චි අම්මා කිතුල් පැණි යොදා රසකැවිලි සාදයි.
II. දහම් පාසලේ මාපිය උපහාර උත්සවයක් පැවැත්වෙයි.
III. කුරුල්ලා කඳු මුදුනේ පිහිටි කුඩා ගසක් මුදුනේ කූඩුව තැනුවේ ය.
IV. කෞතුකාගාරයේ පුරා වස්තු රාශියක් තැන්පත් කර තිබුණි.
V. නිදසුන් දෙස බලා පිළිතුරු ලියන්නට ගුරුතුමිය උපදෙස් දුන්නා ය.
VI. තරඟය ආරම්භ කිරීමට පෙර කාසිය වාසිය උරගා බලයි.
VII. ඇය මියුරු ලෙස රබාන වාදනය කළා ය.
VIII. අලුත ගෙනා මනාලිය ඉතා සුන්දර ය.
IX. නංගී පෙළ පොතෙන් උපුටා බලා ලිවීමක් ලිව්වා ය.
X. කණ්ඩායම ජයග්‍රහණය ලැබීමෙන් උද්දාමය අත්වින්ද හ.
XI. කෑම කෑමට පෙර අත් සේදීම හොඳ සෞඛ්‍ය පුරුද්දකි.
XII. කුරුල්ලෝ හැන්දෑව උදා වීමට පෙර කැදලි කරා පියාඹති.
XIII. ගිරව් රෑන අහසේ පියාඹති.
XIV. මෑත කාලයේ මිනිස්සු ගෑස් පෝලිම් වල සිටිති.
XV. කෑරලා තම පැටවුන්ට කෑම සෙවීමට කැලයට ගියේ ය.



**අක්ෂරමාලාව හා පිල්ලම්**
**පිළිතුරු පත්‍රය**

**1.**

I. අක්ෂර
II. හෝඩිය
III. වර්ණ මාලාව වර්ණ මාලාව
IV. හැඩක්
V. ස්වර අකුරු

ලකුණු 20

**2.**

I. (අ)
II. (ඇ)
III. (ආ)
IV. (ඇ)
V. (ඇ)

**3.**

ලකුණු 20

| අ | ආ |
|---|---|
| ඇලපිල්ල | දෛවය |
| කෙටි ඉස්පිල්ල | පේර |
| දිගු පාපිල්ල | කාලය |
| කොම්බුව හා හල් ලකුණ | කිතුල් |
| කොම්බු දෙක | කූඹියා |

ලකුණු 20

**4.**

I ඉ_ල (බ/හ)
II වර්_නය (ධ/ද)
III ප්‍රමු_ (ක/බ)
IV ග්‍රන්_ය (ත/ථ)
V සමස්_ (ත/ථ)

ලකුණු 20

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ